# ශිල්ප කලා
## 10 ශ්‍රේණිය

## විෂය නිර්දේශය

ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# පටුන

1.0 හැඳින්වීම

2.0 විෂයයේ අරමුණු

3.0 නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය සහ කාලය

4.0 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

5.0 ගුණාත්මක යෙදවුම්

6.0 තක්සේරුකරණය හා ඇගයීම

7.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 1.0 හැඳින්වීම

ශිල්පකලා විෂය ගොඩ නැගී ඇත්තේ, පාරම්පරිකව පැවත එන ජනකලා ආශ්‍රය කර ගනිමිනි. ආදිතමයා තමාගේ අදහස් සිතුම් පැතුම් ප්‍රකාශයට පත් කිරීම හා සෞන්දර්යාත්මක වින්දනය එළි දැක්වීම තුළින් ජනකලා බිහි වන්නට ඇත. විවිධ කලා ශිල්ප මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය. චිත්‍ර, ලී කැටයම්, මූර්ති, ලාක්ෂා, ගල් කැටයම් ඒවායින් සමහර කි.

පසු කාලීනව මෙවැනි ජනකලාවල ට තාක්ෂණය එකතු කර ගැනීම තුළින්, නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට උත්සාහ දරා ඇත. එබැවින් ඒවා කර්මාන්ත බවට පත් විය. ශිල්පකලා විෂයයයේ පසු බිමට පදනම මෙම කර්මාන්ත අතරින් බිහි වූව කි. පාසල් අධ්‍යයනයට යොමු කරන ලද ශිල්පකලා විෂය ක්ෂේත්‍රයට ප්‍රධාන වශයෙන් ඇතුළත් ව ඇත්තේ පේෂ කර්මාන්තය හා මැටි ශිල්පය යන ජනකලා ක්ෂේත්‍රයන් ය.

එම ක්ෂේත්‍රයන් ට අමතර ව කාලීන අවශ්‍යතා ලෙස සැලකෙන විසිතුරු අත්කම් නිර්මාණ ද ශිල්පකලා විෂය තුළ අන්තර්ගතව ඇත. රෙදි පිළි අලංකාර කිරීමේ නව ක්‍රම ඇතුළත් ව ශිල්ප කලා විෂය නවීකරණයට භාජනය කර ඇත. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පදනම් කර ගත්, මෙම විෂය කාර්මික ඇඳීම විෂය තුළින් නිවැරදි හැඩතල ගොඩ නගා ගැනීම සඳහා අත්වැල් සපයා ඇත.

මේ අනුව ශිල්ප කලා විෂයට යොමුවන සිසු දරුවාට ව්‍යවසායකත්ව හැකියා වර්ධනය කර ගැනීමේ අවස්ථාව ද උදාකර ගත හැකි ය.

කලා ශිල්ප විෂයයේ ඉගෙනුම් ක්‍රියාවලියට අනුගතවන දරුවා ඉවසීම ප්‍රගුණ කරයි. ගැටළු විසඳීමේ හැකියාව ලබයි. නිර්මාණශීලී චින්තනයෙන් යුත් හසුරු කුසලතා ප්‍රගුණ කර ගත් කායික හා මානසික වශයෙන් ක්‍රියාශීලී වූ විවේකය ඵලදායී ව ගත කරන දරුවන් බිහි කරවීම ශිල්පකලා විෂයයෙන් අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

පහත සඳහන් සටහනෙන් එම ක්‍රියාවලිය තවදුරටත් පැහැදිලි වනු ඇත.

**ක්‍රියාකාරකම් පෙරටු කර ගත් ශිෂ්‍ය කේන්ද්‍රීය එළඹුම**

**නිර්මාණාත්මක ඉගෙනුම**

**චින්තන හැකියා**

- නිර්මාණශීලී චින්තනය
- විචාරාත්මක චින්තනය
- අභිසාරී හා අපසාරී චින්තනය
- සංඛ්‍යා පිළිබඳ හැකියා
- තීරණ ගැනීම
- ගැටලු විසඳීම

**පෞද්ගලික හැකියා**

- වෙනස්කම් සඳහා යොමු වීම
- ව්‍යවසායකත්ව හැකියා
- විවේකය ඵලදායීව ගත කිරීම
- වගකීම හා වගවීම
- සංස්කෘතික උරුමයන්
- දායාද කර ගත් හැකියා
- ස්වයං විනය

**සමාජ හැකියා**

- සවන් දීම
- අදහස් හුවමාරුව
- කණ්ඩායම් වල වැඩ කිරීම
- සහයෝගය




Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 2.0 කලා ශිල්ප විෂයයේ අරමුණු

කලා ශිල්ප විෂයයෙන් බලාපොරොත්තු වන්නේ සාම්ප්‍රදායික දැනුම පාදක කරගනිමින් නිර්මාණශීලී චින්තනය අවදි කිරීමයි. මේ යටතේ දැනුම, ආකල්ප, කුසලතා හා සමාජ සම්බන්ධතා සමෝධානය වීමෙන් ගොඩ නැගෙන නිපුණතා පෙළක් සාක්ෂාත් කරගැනීම සඳහා ඉගෙනුම්ලාභියාට අවස්ථාව ලැබේ.

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් හරහා මෙම නිපුණතා සංවර්ධනය සිදුකෙරෙනු ඇත. තම අභිරුචිය මත ව්‍යවසායකත්ව හැකියා වර්ධනය කරගැනීමට ශිෂ්‍යයින්ට හැකිවේ.

වඩා සුවිශේෂ වශයෙන් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කෙරේ.

- කලාශිල්ප පිළිබඳ ඓතිහාසික විකාශය හඳුනා ගැනීම.
  - සාම්ප්‍රදායික ජනකලාශිල්ප පිළිබඳ අධ්‍යයනය
  - නව ප්‍රවණතා හඳුනා ගැනීම.
- සමබර පෞරුෂ වර්ධනයකට දායක වීම.
  - චිත්තවේග සමබර කර ගැනීම.
  - ආචාර ධර්මවලට ගරු කිරීමෙන් යහපත් පැවැත්මක් ඇතිකර ගැනීම.
  - කණ්ඩායම්වල සහයෝගයෙන් වැඩකිරීම.
  - විවේකය ඵලදායීව ගත කිරීම.
  - ජීවනෝපාය සඳහා පදනම් සකස්කර ගැනීම.
- ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කර ගැනීම.
  - විවීම් ක්‍රම භාවිතයෙන් නිර්මාණකරණය
  - විවිධ මාධ්‍ය භාවිතයෙන් විසිතුරු නිර්මාණකරණය
  - මැහුම් ක්‍රම භාවිතයෙන් රෙදි ආශ්‍රිත නිර්මාණකරණය
  - සායම් භාවිතයෙන් රෙදිපිළි අලංකරණය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය අන්තර්ගතය හා කාලය

| අංකය | නිපුණතා හා නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලය |
|---|---|---|---|
| 01 | 1. ශ්‍රී ලංකාවේ ජනකලා පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.<br>1.1 ශ්‍රී ලාංකේය ජනකලා පිළිබඳ තොරතුරු රුස්කර වාර්තාවක් සකස් කරයි. | • ජනකලා වර්ග<br>• පේෂ කර්මාන්තය<br>• මැටි කර්මාන්තය<br>• වෙස් මුහුණු සහ කෝලම්<br>• පන් හා කෙඳි කර්මාන්තය<br>• පිත්තල කර්මාන්තය<br>• ලාක්ෂා කර්මාන්තය<br>• බීරලු කර්මාන්තය<br>• ජනකලා ආරම්භය සහ විකාශය<br>• ඓතිහාසික තත්වය<br>• සම්ප්‍රදායික ශිල්ප ක්‍රම<br>• ප්‍රචලිත ප්‍රදේශ<br>• කලා ලක්ෂණ<br>• නූතන ප්‍රවණතා | පැය 01 විනාඩි 20 |
| 02 | 2. යාන්ත්‍රික ඇඳීම උපයෝගී කරගනිමින් ගුණාත්මක බවින් ඉහළ නිමැවුම් සැලසුම් කරයි.<br>2.1. යාන්ත්‍රික ඇඳීම සඳහා ද්‍රව්‍ය උපකරණ තෝරයි | • යාන්ත්‍රික ඇඳීමේ දී භාවිත වන උපකරණ සඳහා සැලකිලිමත් වියයුතු සාධක<br>• ප්‍රමිතියට අනුකූල උපකරණ<br>• පිරිසැලසුම්කරණය<br>• උපකරණ භාවිත කිරීමේ ක්‍රම<br>• නිර්මාණ තාක්ෂණය<br>• යාන්ත්‍රික ඇඳීම සඳහා භාවිතවන උපකරණ<br>• ඇඳීමේ කඩදාසි<br>• ඇඳීමේ පුවරුව හා ටී රූල<br>• පැන්සල්<br>• මකනය<br>• කෝදුව<br>• විහිත චතුරශ්‍ර යුගලය<br>• කෝණ මානය<br>• කවකටුව<br>• බෙදුම් කටුව<br>• ඇගයීම් නිර්ණායක | පැය 01 විනාඩි 20 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | 2.2. මූලික සිද්ධාන්ත භාවිත කර සරල ජ්‍යාමිතික නිර්මාණවල යෙදෙයි. | • ජ්‍යාමිතික නිර්මාණවල දී සැලකිලිමත් වියයුතු සාධක<br>  • මාන හා සංකේත<br>  • ලම්භක නිර්මාණ<br>• පිරිසැලසුම්කරණය<br>  • කඩදාසි වර්ග<br>  • අදාල උපකරණ<br>• නිර්මාණ තාක්ෂණය<br>  • සරල රේඛා ඛණ්ඩයක් සමච්ඡේදනය වන ලෙස ලම්භකයක් ඇඳීම<br>  • සරල රේඛාවක් මත පිහිටි ලක්ෂ්‍යකට ලම්භකයක් ඇඳීම<br>  • සරල රේඛාවේ අන්තයේ පිහිටි ලක්ෂ්‍යකට ලම්භකයක් ඇඳීම<br>  • බාහිර ලක්ෂ්‍යක සිට සරල රේඛාවකට ලම්භකයක් ඇඳීම<br>  • සරල රේඛා ඛණ්ඩයක් සම කොටස් වලට බෙදීම<br>  • ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 2.3. කෝණ සහ ඒ ආශ්‍රිත නිර්මාණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | • කෝණ හා ඒ ආශ්‍රිත නිර්මාණ පිළිබඳ සැලකිලිමත් වියයුතු සාධක<br>  • කෝණ වර්ග<br>    • සුළු කෝණ<br>    • ඍජු කෝණ<br>    • මහා කෝණ<br>    • සරල කෝණ<br>    • පරාවර්තන කෝණ<br>  • කෝණ නිර්මාණය හා කෝණ සමච්ඡේදනය<br>    • කෝණ මානය භාවිත කර කෝණ මැනීම<br>  විහිත චතුරශ්‍ර භාවිතයෙන් කෝණ ඇඳීම<br>    • කෝණ මානය භාවිතයෙන් කෝණ ඇඳීම<br>• කෝණ සමච්ඡේදනය.<br>  • ඍජු කෝණ<br>  • සුළු කෝණ<br>  • මහා කෝණ<br>• පිරිසැලසුම්කරණය<br>  • කඩදාසි වර්ග<br>  • අදාල උපකරණ<br>• නිර්මාණ තාක්ෂණය | පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | | • නියමිත මිනුම<br>• උපකරණ භාවිත ක්‍රම<br>• ඇගයීම් පිළිබඳ නිර්ණායක | |
| | 2.4. බහුඅස්‍ර නිර්මාණයෙහි නිරත වෙයි. | • බහු අස්‍ර නිර්මාණය සඳහා සැලකිලිමත් වියයුතු සාධක<br>• හැඩතල නිර්මාණ<br>  • ත්‍රිකෝණ<br>  • චතුරස්‍ර<br>  • සප්තාස්‍ර<br>  • පංචාශ්‍ර<br>  • ෂඩාශ්‍ර<br>  • ඍජු කෝණාශ්‍ර<br>  • අෂ්ටාශ්‍ර<br>• අදාළ උපකරණ<br>  • කඩදාසි වර්ග<br>• පිරිසැලසුම්කරණය<br>• නිර්මාණ තාක්ෂණය<br>  • උපකරණ නිවැරදිව භාවිතය<br>  • නියමිත මිනුම්<br>• ඇගයීම් නිර්ණායක | පැය 04 |
| | 2.5. වෘත්ත ආශ්‍රිත නිර්මාණ කරයි. | • වෘත්ත ආශ්‍රිත නිර්මාණයේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>• වෘත්ත ආශ්‍රිත නිර්මාණ<br>  • වෘත්තය සම කොටස් දෙකකට බෙදීම<br>  • සමච්ඡේදක ආධාරයෙන් ඉරට්ටේ ගුණාකාරවලට බෙදීම<br>  • වෘත්තයක් සම කොටස් ගණනකට බෙදීම<br>  • සරල රේඛාවක් ස්පර්ශ වන ලෙස වෘත්තයක් ඇඳීම<br>  • වෘත්ත සපර්ශක ඇඳීම<br>• පිරිසැලසුම්කරණය<br>  • අදාළ උපකරණ<br>  • කඩදාසි වර්ග<br>• නිර්මාණ තාක්ෂණය<br>  • උපකරණ නිවැරදිව භාවිත කිරීම<br>  • නිවැරදි මිනුම් යෙදීම<br>• ඇගයීම් නිර්ණායක | පැය 06<br>විනාඩි 20 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | 2.6 සිලින්ඩරයක විකසනය අඳියි.<br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br>2.7 චතුරශ්‍ර ප්‍රිස්මයක විකසනය අඳියි.<br><br><br><br><br><br><br><br><br><br><br><br>2.8 කේතුවක විකසනය අඳියි. | • සිලින්ඩරයක විකසනය ඇඳීම සඳහා සැලකිලිමත් වියයුතු සාධක<br>• සිලින්ඩරයක විකසනය<br>  • රූපීය පෙනුම ඇඳීම<br>  • විකසනය ඇඳීම<br>• පිරිසැලසුම්කරණය<br>  • අදාල උපකරණ<br>  • කඩදාසි වර්ග<br><br><br>• නිර්මාණ තාක්පණය<br>  • සම්මත මිනුම් ක්‍රම භාවිත කිරීම<br>  • උපකරණ නිවැරදිව භාවිත කිරීම<br>• ඇගයීම් නිර්ණායක<br><br><br><br>• චතුරස්‍ර ප්‍රිස්මයක විකසනය ඇඳීමේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>  • නිවැරදි මිනුම් භාවිතය<br>  • නිවැරදිව උපකරණ හැසිරවීම<br>• පිරිසැලසුම්කරණය<br>  • කඩදාසි වර්ග<br>  • අදාල උපකරණ<br>• නිර්මාණ තාක්පණය<br>  • රූපීය පෙනුම<br>  • විකසනය ඇඳීම<br>• ඇගයීම් නිර්ණායක<br><br>• කේතුවක විකසනය ඇඳීමේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>  • නිවැරදි මිනුම් භාවිතය<br>  • නිවැරදිව උපකරණ හැසිරවීම<br>• පිරිසැලසුම්කරණය<br>  • කඩදාසි වර්ග<br>  • අදාල උපකරණ<br>• නිර්මාණ තාක්පණය<br>  • රූපීය පෙනුම<br>  • විකසනය ඇඳීම<br>• ඇගයීම් නිර්ණායක | පැය 02<br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br>පැය 02<br><br><br><br><br><br><br><br><br><br><br><br><br>පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | 2.9 ඉලිප්ස නිර්මාණය කරයි. | • ඉලිප්ස නිර්මාණකරණයේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>• චාප ක්‍රමය<br>• ඒක කේන්ද්‍රික ක්‍රමය<br>• පිරිසැලසුම්කරණය<br>• කඩදාසි වර්ග<br>• අදාල උපකරණ<br>• නිර්මාණ තාක්ෂණය<br>• රූපීය පෙනුම<br>• නිවැරදිව උපකරණ හැසිරවීම<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 2.10 පරාවලය නිර්මාණය කරයි. | • පරාවලය නිර්මාණය සඳහා සැලකිය යුතු සාධක<br>• නිවැරදි මිනුම් භාවිතය<br>• නිවැරදිව උපකරණ භාවිතය<br>• පිරිසැලසුම්කරණය<br>• කඩදාසි වර්ග<br>• අදාල උපකරණ<br>• නිර්මාණ තාක්ෂණය<br>• රූපීය පෙනුම<br>• පරාවලය ඇඳීම<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| 03 | 3. රෙදි පිළි අලංකාර කරයි.<br><br>3.1. අලංකරණය සඳහා භාවිතය කරන රෙදි වර්ග තෝරයි. | • කෙඳි විශේෂය අනුව රෙදි වර්ග භාවිතයේ දී සැලකිය යුතු සාධක<br>• ස්වාභාවික කෙඳි.<br>• ශාක කෙඳි<br>• සත්ව කෙඳි<br>• ඛනිජ කෙඳි<br>• කෘතිම කෙඳි<br>• ස්වාභාවික පොලිමර<br>• කෘතිම පොලිමර<br>• පිරිසැලසුම්කරණය<br>• වර්ණ<br>• ප්‍රමාණ<br>• කෙඳි වර්ගය<br>• නිර්මාණ තාක්ෂණය<br>• රෙදි පරිහරණ ක්‍රම භාවිතය<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | 3.2. රෙදිපිළි , අලංකරණය සඳහා සුදුසු තත්වයට පත් කරයි. | • රෙදිපිළි අලංකරණ සඳහා සුදුසු තත්ත්වයට පත් කිරීමේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>• පෙර පිරියම් කරණය<br>  • කැඳහරණය<br>  • මලහරණය<br>  • විරංජනය<br>• පසු පිරියම්කරණය<br>  • වියළි තාපය ලබාදීම<br>  • තැම්බීම<br>  • හුමාලකරණය<br>• පිරිසැලසුම්කරණය<br>  • විරංජන ද්‍රව්‍ය ප්‍රමාණ<br>  • රෙදිවල වර්ණය<br>• නිර්මාණ තාක්ෂණය<br>  • විරංජනය කිරීම<br>  • රසායනික ද්‍රව්‍ය ඉවත් කිරීම<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 3.3. රෙදි පිළි අලංකරණය සඳහා සුදුසු සායම් වර්ගතෝරා ගනියි. | • රෙදි වර්ග අනුව සායම් තෝරා ගැනීමේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>  • සායම් වල ගුණාංග<br>  • සායම් වර්ග<br>  • සායම්වල ගති ලක්ෂණ<br>• පිරිසැලසුම්කරණය<br>  • වර්ණ<br>  • ප්‍රමාණ<br>• නිර්මාණ තාක්ෂණය<br>  • වර්ණ ගැන්වීම<br>  • වර්ණ ස්ථිර කිරීම<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 3.4. සරල උපකරණ භාවිතයෙන් රෙදිපිළි අලංකාර කරයි. | • සරල උපකරණ භාවිතයේ දී සැලකිය යුතු සාධක<br>  • පාරිභෝගික අවශ්‍යතා<br>  • සම්මත උපකරණ<br>  • විකල්ප උපකරණ<br>  • රෙදි වර්ග<br>  • සායම්<br>• පිරි සැලසුම්කරණය<br>  • මෝස්තර රටා<br>  • චිත්‍ර සටහන් | පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | | • වර්ණ සම්පිණ්ඩනය<br>• නිර්මාණ තාක්ෂණය<br>• මෝස්තර යෙදීම<br>• වර්ණ ගැන්වීම<br>• පසු පිරියම්කරණය<br>• ඇගයීම් නිර්ණායක | |
| | 3.5. තාපබන්ධිත ක්‍රමයෙන් රෙදිපිළි අංලකාර කරයි. (Heat n' bond) | • තාප බන්ධන ක්‍රමයේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>• තාපබන්ධිත කඩදාසි වර්ග<br>• ඒ හා සැසඳෙන රෙදි වර්ග<br>• පාරිභෝගික අවශ්‍යතා<br>• පිරිසැලසුම්කරණය<br>• ගැලපෙන හැඩතල, රූප<br>• මෝසතර රටා<br>• ඉම් රේඛා ඇඳීමට ගැලපෙන වර්ණ<br>• සුදුසු තාපබන්ධිත කඩදාසි<br>• ද්‍රව්‍ය හා උපකරණ<br>• නිර්මාණ තාක්ෂණය<br>• පෙර පිරියම්කරණය<br>• රටා / මෝස්තර / හැඩතල සුදානම් කිරීම<br>• තාප බන්ධිත මාධ්‍ය භාවිතය<br>• ඉම් රේඛා ඇඳීම<br>• පසු පිරියම්කරණය<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 3.6. අච්චු මුද්‍රණ ක්‍රමය භාවිතයෙන් රෙදිපිළි අලංකාර කරයි. | • අච්චු මුද්‍රණ ක්‍රමය භාවිතයේ දී සැලකිය යුතු සාධක.<br>• අච්චු සකස් කරන මාධයන්<br>• ලිනෝලියම්<br>• ලී<br>• අච්චු ලෙස සකස් කර භාවිතයට ගතහැකි පාරිසරික ද්‍රව්‍ය<br>• බණ්ඩක්කා<br>• හබරල පිති<br>• නෙළුම් දඬු<br>• කෙසෙල් පිති<br>• පාරිභෝගික අවශ්‍යතා<br>• පිරිසැලසුම්කරණය<br>• අච්චු ඒකක<br>• හැඩය මතුකර ගැනීම<br>• උපකරණ හා ද්‍රව්‍ය<br>• නිර්මාණ හා තාක්ෂණය | පැය 03 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | | • අච්චු සකස් කිරීම<br>• සායම් සැකසීම<br>• අච්චු භාවිත කර නිර්මාණය<br>• පසුපිරියම්කරණය<br>• ඇගයීම් නිර්ණායක | |
| | 3.7. සිදුරු තහඩු (ස්ටෙන්සිල්) මුද්‍රණ භාවිතකර රෙදිපිළි අලංකාර කරයි. | • සිදුරු තහඩු මුද්‍රණයෙන් රෙදිපිළි අලංකරණය<br>• සිදුරු තහඩු මුද්‍රණය භාවිතයේ දී සැලකිය යුතු සාධක<br>• සිදුරු තහඩු සකස් කිරීමේ මාධ්‍ය<br>• ඝන කඩදාසි<br>• ප්ලාස්ටික් තහඩු<br>• $X`ේ කඩදාසි<br>• ස්ටෙන්සිල් කඩදාසි<br>• පාරිභෝගික අවස්ථා<br>• පිරිසැලසුම්කරණය<br>• සුදුසු මෝසතර නිර්මාණය<br>• උපකරණ ද්‍රව්‍ය<br>• නිර්මාණ තාක්ෂණය<br>• සිදුරු තහඩු සකස් කිරීම<br>• සායම් සැකසීම<br>• සිදුරු තහඩුව භාවිතයෙන් මෝස්තර නිර්මාණය<br>• පසුපිරියම්කරණය<br>• ඇගයීම නිර්ණායක | පැය 02 |
| | 3.8 තිරරාමු මුද්‍රණ ක්‍රමය භාවිතකර රෙදිපිළි අලංකාර කරයි. | • තිර රාමු මුද්‍රණයේ දී සැලකිය යුතු සාධක<br>• පාරිභෝගික අවශ්‍යතා<br>• රාමුව සකස් කිරීම<br>• තිරය සඳහා සුදුසු රෙදි වර්ග<br>• මෝස්තර නිර්මාණය<br>• මුද්‍රණ සඳහා අවශ්‍ය සහායක ද්‍රව්‍ය<br>• පිරිසැලසුම්කරණය<br>• වර්ණ<br>• ද්‍රව්‍ය හා උපකරණ<br>• ප්‍රමාණ<br>• නිර්මාණ තාක්ෂණය<br>• මෝස්තර නිර්මාණය කිරීම<br>• තිර රාමුව සකස් කිරීම<br>• සායම් පාප්පය පිළියෙල කිරීම | පැය 03 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | | • මුද්‍රණ තලය සකස් කිරී<br>• තිරරාමුව භාවිතයෙන් මුද්‍රණය කිරීම<br>• පසුපිරියම්කරණය<br>• ඇගයීම් නිර්ණායක | |
| | 3.9. ගැටපඩු ක්‍රමය භාවිතයෙන් රෙදිපිළි අලංකාර කරයි. | • ගැටපඩු ක්‍රමයේ දී සැලකිය යුතු සාධක<br>  • පාරිභෝගික අවශ්‍යතා<br>  • භාවිත කළයුතු වර්ණ<br>  • වර්ණ බඳුන් සැකසීමේ මූලධර්ම<br>  • රටා මතුකර ගැනීම සඳහා ගැට යෙදීමෙ ක්‍රම.<br>  • පිරිසැලසුම්කරණය<br>    • මෝස්තර ඒකක<br>    • වර්ණක<br>    • ද්‍රව්‍ය හා උපකරණ<br>  • නිර්මාණ තාක්ෂණය<br>  • රටා මතුවන ලෙස ගැට යෙදීම<br>  • රසායනික ද්‍රව්‍ය භාවිතයේ දී නිවැරදි ක්‍රම අනුගමනය කරමින් සායම් බඳුන් පිළියෙල කිරීම<br>  • සායම් ගැන්වීම<br>• පසු පිරියම්කරණය<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 3.10. බතික් ක්‍රමය භාවිතයෙන් රෙදිපිළි අලංකාර කරයි. | • බතික් කිරීමේ දී සැලකිළිමත් විය යුතු සාධක.<br>• පාරිභෝගික අවශ්‍යතා<br>• ඉටි මිශ්‍රණ අනුපාත<br>• වර්ණ භාජන සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය<br>• පිරිසැලසුම්කරණය<br>• සැරසිලි ඒකක<br>• යර්ණ<br>• ප්‍රමාණ<br>• නිර්මාණ තාක්ෂණය<br>• ඉටිමුශ්‍රණ සැකසීම<br>• වර්ණ උරාගැනීමේ කාල පරාසය<br>• පසු පිරික්සුම්කරණය<br>• ඉටි ඉවත් කිරීම<br>• මද පවනේ වේලීම | පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | 3.11. පැච්වර්ක් භාවිතයෙන් රෙදිපිළි විසිතුරු කරයි. | රෙදි කැබලි බද්ධ කිරීමෙන් විසිතුරු නිර්මාණ කරණය<br>• පැච්වර්ක් ක්‍රමයේදී සැලකිය යුතු සාධක (PATCH WORK)<br>  • පාරිභෝගික අවශ්‍යතා<br>  • සුදුසු රෙදි වර්ග<br>  • විවිධ හැඩතල<br>  • වර්ණ<br>• පිරිසැලසුම්කරණය<br>  • හැඩතල ඒකක<br>  • වර්ණ සම්පිණ්ඩනය<br>  • විසිතුරු මැහුම් ක්‍රම<br>  • ද්‍රව්‍ය හා උපකරණ<br>• නිර්මාණ හා තාක්ෂණය<br>  • රෙදි වර්ග තෝරා ගැනීම<br>  • වර්ණ ගැලපීම<br>  • පතරොම සකස් කිරීම<br>  • හැඩතල කැපීම<br>  • කැබලි බද්ධ කිරීම<br>  • විසිතුරු මැහුම්ක්‍රම යෙදීම<br>  • නිමාව<br>  • පසුපිරියම්කරණය.<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 3.12. නෙට්වර්ක් ක්‍රමය භාවිතයෙන් රෙදිපිළි විසිතුරු කරයි. | • නිර්මාණකරණයේ දී සැලකිය යුතු සාධක<br>  • පාරිභෝගික අවශ්‍යතා<br>  • ඉවත් කරන කොටස් කැපීමේදී සැලකියයුතු දේ<br>  • අළුත් කොටස් එකතු කිරීමේ ක්‍රම ශිල්ප<br>  • අලංකරණයේදී භාවිත කළහැකි නව ප්‍රවණතා<br>• පිරිසැලසුම්කරණය<br>  • මෝසතර ඒකක<br>  • උපාංග<br>  • ද්‍රව්‍ය හා උපකරණ<br>• නිර්මාණ තාක්ෂණය<br>  • මෝස්තරයේ ඉවත් කළයුතු කොටස් ඉවත් කිරීම<br>  • අදාල කොටස් කපා ඉවත් කිරීම<br>  • නව කොටස් එකතු කිරීම<br>  • විවිධ ක්‍රම ශිල්ප භාවිතයෙන් විසිතුරු කිරීම.<br>  • නිමාව<br>  • පසුපිරියම්කරණය<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| 04 | 4. වියමන් ක්‍රම භාවිතයෙන් නිර්මාණකරණයෙහි යෙදෙයි.<br>4.1. සාම්ප්‍රදායික වාම් වියමන් රටා භාවිත කර වියයි. | වියමන් රටා ප්‍රභේද<br>• මූලික වියමන් ක්‍රම සහ ඒවායේ ප්‍රභේද<br>• වාම් වියමන<br>• හීරි වියමන<br>• සැටින් වියමන<br>• වාම් වියමනේ ප්‍රභේද<br>• වාම් වියමන<br>• ජටා වියමන<br>• දික්දාර වියමන<br>• හරස්දාර වියමන<br>• වියමන් රටා භාවිතයේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>• පාරිභෝගික අවශ්‍යයතා<br>• පුද්ගල භාවිතය<br>• ගෘහස්ථ භාවිතය<br>• මාධ්‍ය තෝරා ගැනීම<br>• පිරිසැලසුම්කරණය<br>• වර්ණ<br>• ප්‍රමාණ<br>• රටා ඒකක<br>• රටා නිර්මාණ තාක්ෂණය<br>• තෝරාගත් රටා භාවිතකර ගෘහ අලංකරණය නිර්මාණ සැකසීම<br>• බඳුන් පලස් විවීම<br>• බිත්ති සැරසිලි විවීම<br>• මේස දරණු විවීම<br>• පසුපිරියම්කරණය<br>• ඇගයීම් නිර්ණායක | පැය 03 |
| | 4.2 සාම්ප්‍රදායික සරල හීරි වියමන් රටාව භාවිත කරයි. | • හිරි වියමන් රටා<br>• සරල හීරි වියමන<br>• සරල හිරි වියමන් රටාව ප්‍රස්ථාරගත කිරීමේ දී සැලකිය යුතු සාධක<br>• නූල් මතුවීමේ ස්වභාවය<br>• ඒකකයට ඇතුළත් විය යුතු නූල් ප්‍රමාණය<br>• පිරිසැලසුම්කරණය<br>• ප්‍රස්ථාර කඩදාසි<br>• වර්ණ ගැලපීම<br>• නිර්මාණ තාක්ෂණය<br>• ප්‍රස්ථාරගත කිරීම<br>• නූල් ඇදීමේ ක්‍රම | පැය 03 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | | |
|---|---|---|---|---|
| | | • පුඩුවැල් හා පාපොලු සම්බන්ධ කිරීමේ තාක්ෂණය<br>• පාපොලු ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණය<br>• රටාව අනුව නූල් මතුවීමේ ස්වභාවය<br>• ඇගයීම් නිර්ණායක | | |
| | 4.3 තුඩු හිරි, දහරහිරි සහ රුවිතහිරි වියමන් රටා භාවිත කරයි. | • වියමන් රටා ප්‍රස්ථාරගත කිරීමේ දී සැලකිය යුතු සාධක<br>• රටාවට අදාලව නූල් මතුවීමේ ස්වභාවය<br>• ඒකකකයට ඇතුළත් වියයුතු නූල් ප්‍රමාණය<br>• පිරිසැලසුම්කරණය<br>• වියමන් රටා ඒකක<br>• ප්‍රස්ථාර කඩදාසි<br>• වර්ණ ගැලපීම<br>• නිර්මාණ තාක්ෂණය<br>• ප්‍රස්ථාරගත කිරීම<br>• නූල් ඇදීමේ ක්‍රම<br>• පුඩුවැල් හා පාපොලු සම්බන්ධ කිරීමේ තාක්ෂණය<br>• පාපොළු ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණය<br>• රටාව අනුව නූල් මතුවීමේ ස්වභාවය<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 | |
| | 4.4. කඩහිරි රළ හිරි වියමන් භාවිත කරයි. | • වියමන් රටා ප්‍රස්ථාරගත කිරීමේදී සැලකිය යුතු සාධක<br>• නූල් මතුවීමේ ස්වභාවය<br>• ඒකකයකට ඇතුළත් විය යුතු නූල් ප්‍රමාණය<br>• පිරිසැලසුම්කරණය<br>• රටා ඒකක<br>• වර්ණ ගැලපීම<br>• නිර්මාණ තාක්ෂණය<br>• ප්‍රස්ථාරගත කිරීම<br>• නූල් ඇදීමේ ක්‍රම<br>• පුඩුවැල් හා පාපොළු සම්බන්ධ කිරීමේ තාක්ෂණය<br>• පාපොළු ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණය<br>• රටාවට අනුව නූල් මතුවීමේ ස්වභාවය<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | 4.5. සංයෝජිත හීරි සහ විසිතුරු හීරි වියමන් ක්‍රම භාවිත කරයි. | • වියමන් රටා ප්‍රස්ථාරගත කිරීමේ දී සැලකිය යුතු සාධක<br>• ඒකකයකට ඇතුළත් විය යුතු නූල් ප්‍රමාණය<br>• නූල් මතුවීමේ ස්වභාවය<br>• පිරිසැලසුම්කරණය<br>• වියමන් රටා ඒකක<br>• ප්‍රස්ථාර කඩදාසි<br>• වර්ණ ගැලපීම | පැය 02 |
| | 4.6 මීවද හා හාක්ක වියමන් භාවිත කරයි | • මීවද හා හාක්ක වියමන් රටා ප්‍රස්ථාරගත කිරීමේ දී සැලකිය යුතු සාධක<br>• නූල් මතුවීමේ සාධක ස්වභාවය<br>• ඒකකයකට ඇතුළත් විය යුතු ප්‍රමාණය<br>• පිරිසැලසුම්කරණය<br>• වියමන් රටා ඒකක<br>• ප්‍රස්ථාර කඩදාසි<br>• වර්ණ ගැලපීම.<br>• නිර්මාණ තාක්ෂණය<br>• ප්‍රස්ථාර ගත කිරීම<br>• පුඩුවැල් හා පාපොලු සම්බන්ධ කිරීමේ තාක්ෂණය<br>• රටාවට අනුව නූල් මතුවීමේ ස්වභාවය<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 4.7 සැටින් වියමන් රටා භාවිත කරයි. | • සැටින් වියමන් රටා ප්‍රස්ථාරගත කිරීමේ දී සැලකිය යුතු සාධක<br>• ඒකකයකට ඇතුළත් විය යුතු නූල් ප්‍රමාණය<br>• නූල් මතුවීමේ ස්වභාවය<br>• වියමන් රටා ප්‍රස්ථාර ගත කිරීමේ දී සැලකිය යුතු සාධක<br>• නූල් මතුවීමේ ස්වභාවය<br>• ඒකකයකට ඇතුළත් විය යුතු නූල් ප්‍රමාණය<br>• පිරිසැලසුම්කරණය<br>• වියමන් රටා ඒකක<br>• ප්‍රස්ථාර කඩදාසි<br>• වර්ණ ගැලපීම<br>• නිර්මාණ තාක්ෂණය<br>• ප්‍රස්ථාරගත කිරීම<br>• නූල් ඇදීමේ ක්‍රම | පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | | • පුඩුවැල් හා පාපොලු සම්බන්ධ කිරීමේ තාක්ෂණය<br>• පාපොලු ක්‍රියාත්මක කිරීමේ තාක්ෂණය<br>• රටාවට අනුව නූල් මතුවීමේ ස්වභාවය<br>• ඇගයීම් නිර්ණායක | |
| 05 | 5. ගෙතීමේ රටා භාවිතයෙන් නිර්මාණකරණයෙහි යෙදෙයි.<br>5.1 තනි කටුව භාවිතයෙන් ගෙතීමේ ක්‍රියාවලියෙහි යෙදෙයි. | • ගෙතීමේ ශිල්පක්‍රම<br>• ගෙතීමේ දී සැලකිලිමත් වියයුතු සාධක<br>• මෝස්තර ප්‍රස්තාර ගත කිරීම<br>• භාවිත කරන මාධ්‍යට අනුව ගෙතුම් කටු තේරීම.<br>• පිරිසැලසුම්කරණය<br>• මාධ්‍ය තෝරා ගැනීම<br>• නූල් / වූල්<br>• සැලසුම් චිත්‍ර<br>• වර්ණ<br>• ප්‍රමාණ<br>• නිර්මාණ තාක්ෂණය<br>• තනිපට පිරවිලි<br>• දෙපට පිරවිලි<br>• තුන්පට පිරවිලි<br>• මෝසතර හා හැඩතල<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 5.8. නිර්මාණයට අදාල හැදය යන්ත්‍රගත කරයි. | • නූල් හැදය යන්ත්‍රගත කිරීම<br>• යන්ත්‍රගත කිරීමේදී සැලකියයුතු සාධක<br>• යන්ත්‍රයක කොටස්<br>• රටාවට අනුව නූල් ඇදීම<br>• නූල් විවර ලබා ගැනීම<br>• යන්ත්‍රගත කිරීමේ තාක්ෂණය<br>• රටාවට අනුව පුඩුවැල් වලින් නූල් ඇදීම<br>• නියමිත පළල අනුව පනාවෙන් නූල් ඇදීම<br>• ලීවර හා පපොලු සම්බන්ධ කිරීම<br>• පඩුවැල් සම්බන්ධ කිරීම<br>• ඇගයීම් නිර්ණායක | පැය 02 |
| | 5.9. විවීම් තාක්ෂණය භාවිත කරයි. | • නිර්මාණයට අදාලව විවීම<br>• විවීමේදී සැලකිලිමත් වියයුතු සාධක<br>• අදාල උපකරණ<br>• විවීමේ ශිල්පීය ක්‍රම | පැය 02 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | | • පිරිසැලසුම්කරණය<br>• වර්ණ<br>• රටා ඒකක<br>• විවීමේ තාක්ෂණය<br>• හැඩ නූල් කුරු එතීම<br>• නඩාවට නූල් කුරු සම්බන්ධකර ගැනීම<br>• පාපොලු ක්‍රියාකරවීම<br>• නඩාව ගමන් කරවීම<br>• අළුව භාවිත කරමින් විවීම<br>• පතුරු ආධාරයෙන් විසිතුරු මෝස්තර යෙදීම (ටැබම්ට්‍රි විවීම)<br>• නිමහම් කිරීම<br>• ඇගයීම් නිර්ණායක | |

## 4.0 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

මෙම පාඨමාලාවට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය තීරණය කිරීමේ දී ගවේෂණය පදනම් කර ගෙන සිසු නිපුණතා ගොඩනැගීමට හැකි වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිපුණතා පාදක අධ්‍යාපනය සඳහා මෙසේ සූදානම් වීමේ දී ගුරු භූමිකාවේ ද පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ.

ඈත අතීතයේ සිට අපේ පන්ති කාමරවල බහුල ව ක්‍රියාත්මක වූ සාම්ප්‍රදායික සම්ප්‍රේෂණ භූමිකාව (TRANSMISSION ROLE) හා පසු කාලීන ව හඳුන්වා දෙනු ලැබූ ගනුදෙනු භූමිකාව (TRANSACTION ROLE) වර්තමාන පන්තිකාමර තුළ තවමත් කැපී පෙනේ. පාසල් හැර යන දරු දැරියන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතාවල අද දක්නට ලැබෙන පිරිහීම පිළිබඳ සලකා බලන විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය විය යුතු බවත් එය සිදු විය යුතු ආකාරයත් හඳුනා ගැනීම අපහසු නොවේ.

සම්ප්‍රේෂණ ගුරු භූමිකාවේ දී සිසුන් උගත යුතු සියල්ල දන්නා අයෙකු ලෙස ගුරුවරයා පිළිගැනෙන අතර සිසුන් ඒ කිසිවක් නොදන්නා අය ලෙස සලකා ඔවුන් වෙත දැනුම සම්ප්‍රේෂණය කිරීම ගුරු කාර්යය බවට පත්වී තිබේ. ගුරුවරයාගෙන් සිසුනට දැනුම ගලා යාමට පමණක් සීමා වන දේශන මුහුණුවරක් ගන්නා මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිසු චින්තනය අවදි කිරීමට හෝ සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමට හෝ ප්‍රමාණවත් ව දායක නොවේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ගුරුවරයා පන්තිය සමග ඇති කර ගන්නා දෙබස ගනුදෙනු භූමිකාවේ ආරම්භක අවස්ථාව වේ. ගුරුවරයාගෙන් පන්තියට හා පන්තියෙන් ගුරුවරයාට ගලා යන අදහස්වලට අමතර ව සිසු-සිසු අන්තර් ක්‍රියා ද පසු ව ඇති වීම නිසා මෙම දෙබස ක්‍රමයෙන් සංවාදයකට පෙරළේ. දන්නා දෙයින් නොදන්නා දෙයට, සරල දෙයින් සංකීර්ණ දෙයට මෙන් ම සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් ගෙන යාම සඳහා ගුරුවරයා දිගින් දිගට ම ප්‍රශ්නකරණයේ නිරත වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයෙකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයෙකුගේ (RESOURCE PERSON) තත්ත්වයට ගුරුවරයා පත් වේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීපව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනා ගැනීම, අවශ්‍ය ඉදිරිපෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්තිකාමරයෙන් බැහැරට ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ. යථෝක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොට ගත් ගුරු භූමිකාව පරිණාමන භූමිකාව (TRANSFORMATION ROLE) ලෙස නම් කර තිබේ.

මෙම පාඨමාර්ගයේ පළමු කොටස මගින් හඳුන්වා දෙනු ලබන විස්තරාත්මක විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් සන්තතිය එහි දෙවැනි කොටසට ඇතුළත් කර ඇත. මේ සෑම ක්‍රියාකාරකමක් ම අඩු තරමින් පියවර තුනක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කර තිබේ. ක්‍රියාකාරකම්වල පළමු වන පියවර මගින් සිසුන් ඉගෙනුමට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. එබැවින් මෙම පියවර සම්බන්ධ කර ගැනීමේ පියවර (ENGAGEMENT STEP) වශයෙන් නම් කර තිබේ. මෙහි ආරම්භයක් ලෙස ගුරුවරයා ගනුදෙනු භූමිකාවේ ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සිසුන් සමඟ දෙබසකට මුල පුරයි. පසු ව සංවාදයකට පරිවර්තනය විය හැකි මේ දෙබස යටතේ ගවේෂණයේ යෙදීමෙන් සිසුන් සංවර්ධනය කර ගත යුතු මූලික නිපුණතා හා සම්බන්ධ පෙර දැනුම සිහිපත් කර ගැනීමටත්, ක්‍රියාකාරකම්වල ඉදිරිය පිළිබඳ ඉඟි ලබා ගැනීමටත් සිසුනට අවස්ථාව සැලසේ. මෙම අදහස් හුවමාරුව සඳහා යොදා ගත හැකි උපක්‍රම රාශියක් ගුරුවරයා සතු ව ඇත. ප්‍රශ්න ඉදිරිපත් කිරීම / පින්තූර, පුවත්පත් දැන්වීම් හා සැණ පත් (FLASH CARDS) වැනි උත්තේජක යොදා ගැනීම / ගැටලු, ප්‍රහේලිකා හෝ සිද්ධි අධ්‍යයන භාවිතය / දෙබස්, භූමිකා රංගන, කවි, ගීත, ආදර්ශන (DEMONSTRATIONS) ඍජුව හෝ ශ්‍රව්‍ය පට හෝ දෘශ්‍ය පට ඇසුරෙන් යොදා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ගැනීම මෙවන් උපක්‍රම කිහිපයකි. සාරාංශ වශයෙන් පහත සඳහන් අරමුණු තුන සාක්ෂාත් කර ගැනීම මුල් කොට ක්‍රියාකාරකම්වල පළමු පියවර ක්‍රියාත්මක වේ.

- පන්තියේ අවධානය දිනා ගැනීම.
- අවශ්‍ය පෙර දැනුම සිහිපත් කර ගැනීමට සිසුනට අවස්ථාව ලබාදීම.
- ක්‍රියාකාරකමේ දෙවැනි පියවර යටතේ සිසුන් යොමු කිරීමට අපේක්ෂා කරන ගවේෂණයේ මූලිකාංග සිසුනට හඳුන්වා දීම.

ක්‍රියාකාරකමේ දෙවැනි පියවර සැලසුම් කර ඇත්තේ ගවේෂණය (EXPLORATION) සඳහා සිසුනට අවස්ථාව ලබා දීමටය. සිසුන් ගවේෂණයේ යෙදෙන්නේ ඒ සඳහා සුවිශේෂ ව සකස් කරන ලද උපදෙස් පත්‍රිකාවක් පදනම් කර ගෙන ය. ගැටලුවට සම්බන්ධ විවිධ පැති කණ්ඩායම් වශයෙන් ගවේෂණය කරමින් සහයෝගී ඉගෙනුමේ යෙදීමට සිසුනට හැකි වන පරිදි මෙම ගවේෂණය සැලසුම් කිරීමට ගුරුවරයාට සිදු වේ. සපයා ඇති සම්පත් ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින්, සතිමත් බවෙන් යුතු ව කණ්ඩායම් සාකච්ඡා මෙහෙයවමින් සිසුන් ගවේෂණයේ නිරතවීම මෙම පියවරේ වැදගත් ලක්ෂණ කිහිපයක් වේ. කාලයක් තිස්සේ එබඳු කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා ස්වයං විනය, අන්‍යයන්ට සවන්දීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනට උදවු වීම, කාල කළමනාකරණය, ගුණාත්මක බවෙන් ඉහළ නිපැයුම් ලබා ගැනීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වැදගත් කුසලතා රැසක් සංවර්ධනය කර ගැනීමට ද සිසුනට හැකියාව ලැබේග

සිසුන් ගවේෂණය සඳහා යොමු කිරීමේ දී ශිෂ්‍ය කණ්ඩායම්වල නායකත්වය පිළිබඳ තීරණ ගැනීමෙන් ගුරුවරයා වැළකි සිටිය යුතු අතර සිසුන් අතරින් නායකයන් මතුවීමට අවශ්‍ය පසුබිම පමණක් මැනවින් සූදානම් කළ යුතු ය. සැඟවුනු හැකියා පදනම් කර ගනිමින් අවස්ථාවෝචිත ව නායකත්වය ගැනීමේ වරප්‍රසාදය මේ අනුව සිසුනට හිමි වේ.

ක්‍රියාකාරකමේ 3 වන පියවරේ දී සෑම කණ්ඩායමකට ම තම ගවේෂණ ප්‍රතිඵල අන් අයගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසේ. මෙහි දි ගුරුවරයා කළ යුත්තේ සමූහ ඉදිරිපත් කිරීම් සඳහා සිසුන් දිරිමත් කිරීමයි. සෑම සාමාජිකයෙකුට ම වගකීම් පැවරෙන පරිදි ඉදිරිපත් කිරීම් සැලසුම් කිරීමට සිසුන් මෙහෙයවීම ද වැඩදායකය. සිසු අනාවරණ පැහැදිලි කිරීම (EXPLANATION) හා සම්බන්ධ මෙම පියවරේ වැදගත් ලක්ෂණයක් වන්නේ අපේ පන්තිකාමර තුළ නිතර ඇසෙන ගුරු කථනය වෙනුවට සිසු හඬ මතු වීමට අවස්ථා සම්පාදනය වී තිබීමය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ක්‍රියාකාරකම්වල තෙවන පියවරේ දී සොයාගැනීම් වැඩිදියුණු කිරීමට නැත්නම් විස්තාරණයට (ELABORATION) සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. එක් එක් කණ්ඩායම ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අවසන් කළ පසු ඒ පිළිබඳ සංවර්ධනාත්මක යෝජනා මතු කිරීමට ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුනට පළමුව ද අනෙක් කණ්ඩායම්වල සිසුනට දෙවනුව ද අවස්ථාව ලබා දීමෙන් මෙය සිදු කෙරේ. කෙසේ වෙතත් අවසාන සමාලෝචනය බාර වන්නේ ගුරුවරයාටය. සිසුන් නිරත වූ ගවේෂණයට අදාළ වැදගත් කරුණු සියල්ල පැහැදිලි වන සේත් සංකල්ප හා න්‍යායයන් පිළිබඳ නිවැරදි අවබෝධය සිසුන් තුළ තහවුරු වන සේත් මෙම සමාලෝචනය සිදු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක ව ඉටු වන්නේ දැයි නිරතුරු ව සොයා බැලීම මෙම ක්‍රමවේදය යටතේ ගුරුවරුන් සතු ප්‍රධාන වගකීමකි. මේ සඳහා තක්සේරුකරණය හා ඇගයීම යොදා ගත යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ම ලබා ගැනීමට සැලසුම්ගත ක්‍රියාකාරකම් ගුරුවරයාට අවස්ථාව සලසා දේ. ක්‍රියාකාරකමේ 2 පියවර යටතේ සිසුන් ගවේෂණයේ යෙදෙන විට තක්සේරුවටත් (ASSESSMENT), ක්‍රියාකාරකමේ තෙවන පියවර යටතේ සිසුන් පැහැදිලි කිරීම් හා විස්තාරණයට යොමු වන විට ඇගයීමටත් (EVALUATION) ගුරුවරයාට ඉඩ තිබේ. තක්සේරුකරණය හා ඇගයීම පිළිබඳ විස්තරාත්මක විමසුමක් මෙම ලේඛනය යටතේ මතු දැක්වේ.

මේ දක්වා විස්තර කරන ලද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පරිණාමන භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරයා යොමු කරවයි. මෙහි දි කණ්ඩායම් ගවේෂණයට මුල් තැන ලැබෙන අතර ගනුදෙනුව, සංවාදය හා කෙටි දේශන සඳහා ද ගුරුවරයාට අවකාශ සැලසේ. ප්‍රවේශ පියවරේ දී ගනුදෙනුවට හා සංවාදයට අවස්ථා ඇති අතර අවසාන පියවරේ සමාලෝචනය යටතේ කෙටි දෙසුමකට හා සංකල්ප තහවුරු කිරීමට ගුරුවරයාට ඉඩ ඇත. නව සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් වන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව සම්ප්‍රේෂණ හා ගනුදෙනු ගුරු භූමිකාවන්ට අදාළ වැදගත් ලක්ෂණ ගැන ද සැලකිලිමත් වීම මෙම ක්‍රමවේදයේ විශේෂත්වය ලෙස සඳහන් කළ හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 5.0 ගුණාත්මක යෙදවුම්

නිපුණතා පාදක ක්‍රියාකාරී අධ්‍යාපනය සඳහා ගුණාත්මක යෙදවුම් සුලභ , පන්ති කාමර වාතාවරණයක් අවශ්‍ය වනු ඇත. මෙම ගුණාත්මක යෙදවුම් කල් ඇතිව ඇණවුම් කර ලබා ගැනීම සඳහා පහත සඳහන් කර ඇති අතර සිසුන් යෙදවීමට අපේක්ෂා කරන නිර්මාණ සැලකිල්ලට ගනිමින් අවශ්‍ය තීරණ ගැනීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

| උපකරණ | අමු ද්‍රව්‍ය |
|---|---|
| පුස්තකාල :- . හෙළකලා ඉතිහාසය<br>• මධ්‍යකාලීන සිංහල කලා<br>• කවකටු පෙට්ටි<br>• ඩ්‍රොවින් කඩදාසි (විවිධ ප්‍රමාණ)<br>• පැන්සල් වර්ග (විවිධ වර්ග)<br>• ඇඳීමේ පුවරුව (Drawing Board)<br>• සව්කිරීමේ ආධාරක<br>• පින්සල් ( විවිධ ප්‍රමාණ)<br>• ස්ටෙන්සිල් පිහි<br>• මිණුම් පටි<br>• අත් වැසුම්<br>• සායම් පලකය<br>• ප්ලාස්ටික් බේසම්<br>• ප්ලාස්ටික් හැඳි<br>• ප්ලාස්ටික් බාල්දි<br>• ගෑස් ලිප<br>• ගෑස් සිලින්ඩරය<br>• කතුරු - ( රෙදි කපන කතුරු , එම්බ්‍රොයිඩර් කතුරු)<br>• සාස් පාන්. 10cm 30 cm.<br>• ගෙතුම් කටු. ( ප්‍රමාණ අනුව)<br>• නඩාව (පටල් )<br>• දික්නූල් කුරු.<br>• හැඩ නූල් කුරු<br>• කැපුම් තල (Paper Knife)<br>• අත් කියත<br>• පොදු අත් කඩුව<br>• මිටිය (Hammer)<br>• ඩ්‍රෝයින් ඇණ (Drawing Pins)<br>• පුඩුවැල් පේළි (විවිධ ප්‍රමාණ)<br>• පනාව (විවිධ ප්‍රමාණ)<br>• විවීමේ අත් යන්ත්‍රයක් (කුඩා)<br>• යකඩ ඇණ. (විවිධ ප්‍රමාණ)<br>• කුඩා මේස හැන්දක් | • කපු රෙදි (සුදු සහ වෙනත් වර්ණ)<br>• පෙල්ට් රෙදි<br>• පැබ්රික් වර්ණක<br>• බතික් වර්ණක<br>• වැට් සායම්<br>• බ්‍රිස්ටල් බෝඩ්<br>• තාපබන්ධිත කඩදාසි. (Heat and Bond)<br>• ට්වයින් නූල්<br>• බයින්ඩර් ගම්<br>• සෙලෝ ටේප්<br>• සැහැල්ලු ලී<br>• ලැකර් ( විවිධ වර්ණ )<br>• ඕගන්දි රෙදි.<br>• ස්පොන්ච් කැබලි.<br>• මී ඉටි<br>• පැරපින් ඉටි<br>• රටදුම්මල<br>• සබන්<br>• විවිධ වර්ණ නූල් (මැසීම සඳහා)<br>• විවිධ වර්ණ වුල්<br>• විවිධ වර්ණ රිබන්<br>• ක්‍රොචට් නූල්<br>• නෙට් රෙදි<br>• පබලු (විවිධ ප්‍රමාණ අනුව)<br>• කම්බි.<br>• කෘත්‍රිම මල්<br>• ස්වාභාවික මල්<br>• ගම්ටේප් (කොල පැහැති)<br>• ඩ්‍රයි ස්පොන්ච්<br>• ආභරණ ඇමුණුම් උපාංග හා ආධාරක.<br>• කාඩ්බෝඩ්<br>• සෘජු ෆෝම්<br>• ලෑලි කැබලි |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | |
|---|---|
| • ඉදල<br>• කොස්ස<br>• ඉසින යන්ත්‍ර (Spray Gun)<br>• රෝලර් (වර්ණ ගන්වන)<br>• පෙනේර<br>• කෝදුව<br>• ඉදිකටු (විවිධ ප්‍රමාණවලින්)<br>• ලී රෝලරය<br>• ලංකා සිතියම | • නූල් මල් (ප්‍රමාණය අනුව)<br>• ප්‍රස්ථාර කඩදාසි.<br>• මැටි<br>• සිමෙන්ති<br>• ගෝනි රෙදි<br>• ප්ලාස්ටර් ඔප් පැරිස්.<br>• කුකුල් ඇල්<br>• කාබන් කඩදාසි<br>• පිළිස්සූ මැටි බඳුන්<br>• වාර්නිස් කඩදාසි.<br>• ඩිමයි කඩදාසි<br>• පැලැටිග්නම් පෑන්<br>• මාකර් පෑන්<br>• ගිනිපෙට්ටි<br>• බයින්ඩර් ගම්<br>• වාර්නිෂ්<br>• ඉමල්පත් තීන්ත<br>• වයින්ස්ප්‍රිට්<br>• කෝස්ටික් සෝඩා<br>• ටී පෝල්<br>• ටර්කිරේඩ් ඩයිල්<br>• දිය ලුණු<br>• සෝඩියම් සිලිකේට්<br>• සෝඩා ඇෂ්<br>• විරංජන කුඩු<br>• A4 කඩදාසි<br>• කඩදාසි වර්ග (සැව්, වාර්නිෂ්, ක්‍රේප්, කාබන්, මාබල්)<br>• කෙඳි වර්ග<br>• පත් වර්ග<br>• පැඩින්<br>• අයිඩා ක්ලෝත්<br>• කැන්වස් |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6.0 තක්සේරුව හා ඇගයීම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් අපේක්ෂිත ඉගෙනුම් ඵල සිසුන් විසින් සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම සඳහාත් සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩසටහන් දෙකක් ලෙස තක්සේරුව හා ඇගයීම හඳුන්වා දිය හැකිය. තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සියලු ම සිසුනට අදාළ නිපුණතා සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාව වත් ලබා ගැනීම අපහසු නොවේ. අනෙක් අතට ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරු කිරීමේ යෙදී සිටින ගුරුවරුනට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (FEED BACK) හා ඉදිරිපෝෂණය (FEED FORWARD) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වේ.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ නිපුණතා අතරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගැනීම අවශ්‍ය වේ. ඇගයීම් වැඩපිළිවෙල ඔස්සේ සිසුන් ලඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවයන්ට සිසු ප්‍රගතිය සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු වේ.

ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය (STUDENT-CENTRED), නිපුණතා පාදක (COMPETENCY-BASED) ක්‍රියාකාරකම් දිශාභිමුඛ (ACTIVITY-ORIENTED) කර ගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ජීවිතය අර්ථවත් කර ගැනීම සඳහා ක්‍රියාවෙන් ඉගෙනුම, ගුරුවරයාගේ පරිණාමන භූමිකාවේ (TRANSFORMATION ROLE) හරය වේ.

පූර්වයෙන් සංවර්ධනය කළ ක්‍රියාකාරකම් සන්තතියක් ඔස්සේ ක්‍රියාත්මක වන මෙම විෂයමාලාව ඉගෙනුම හා ඉගැන්වීම, තක්සේරුව හා ඇගයීම සමඟ සමෝධානය කිරීමට උත්සාහ දරා ඇත. ඒ ඒ ක්‍රියාකාරකම්වල දෙවැනි පියවරේ දී සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන විට ඔවුන් තක්සේරුකරණයටත් ක්‍රියාකාරකම්වල තුන් වැනි පියවරේ දී සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කිරීමට හා විස්තාරණයට යොමු වන විට ඔවුන් ඇගයීමටත්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ගුරුවරයාට හැකි වේ. සිසුන් ගවේෂණයේ යෙදෙන විට සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් සිසුන් මුහුණපා ඇති ගැටලු පන්ති කාමරය තුළ දී විසඳා ගැනීම සඳහා පහසුකම් සහ මාර්ගෝපදේශකත්වය සපයා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ. මෙම නිර්ණායක අතරෙන් පළමු නිර්ණායක තුන ඒ ඒ නිපුණතාව ගොඩ නැගීමට ඒකරාශි වී තිබෙන දැනුම, ආකල්ප හා කුසලතා මූලික කොට සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා දෙකක් ප්‍රගුණ කර ගැනීමට සිසුනට අත දේ. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පහ පන්තිකාමරය තුළ සිසුන් ක්‍රියාත්මක වීමේ දී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු අතර තක්සේරුව යටතේ එම චර්යා ගොඩ නැගීම තහවුරු කිරීමටත් ඇගයීම යටතේ එසේ ගොඩ නගා ගත් චර්යා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු වේ.

තක්සේරුව හා ඇගයීම පිළිබඳ වැඩපිළිවෙල වැඩිදියුණු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පුළුල් කළ හැකිය. මෙසේ ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා මූලින්ම කළ යුත්තේ ක්‍රියාකාරකම් සන්තතියට ඇතුළත් ක්‍රියාකාරකම්, කාණ්ඩ කිහිපයකට වෙන්කර ගැනීමයි. සිසු ඉගෙනුම විකසිත කළ හැකි ප්‍රභේද කිහිපයක් ඒ ඒ ක්‍රියාකාරකම් කාණ්ඩය හා බැඳෙන විෂය සන්ධාරය පදනම් කර ගනිමින් දෙවනුව හඳුනා ගත යුතුයි. තෝරාගත් ප්‍රභේද පදනම් කර ගෙන ගුරුවරයාට හා සිසුන්ට උපදෙස් ඇතුළත් වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය දීර්ඝ කෙරෙන උපකරණ සකසා ගැනීම ඊළඟ පියවර වන අතර සෑම ක්‍රියාකාරකම් කාණ්ඩයක් ආරම්භයේ දී ම මෙම උපකරණ සිසුන්ට හඳුන්වා දීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යයි. මේ අනුව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරුවරයෙකුට යොදා ගත හැකි ප්‍රභේද කිහිපයක් මතු දැක් වේ.

- සංකල්ප සිතියම් (CONCEPT MAPS)
- බිත්ති පුවත්පත් (WALL NEWS PAPERS)
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් (QUIZZES)
- ප්‍රශ්න සහ පිළිතුරු පොත් (QUESTION AND ANSWER BOOKS)
- ශිෂ්‍යය කාර්ය සාධන ගොනු (PORTFOLIOS)
- සිසු නිර්මාණ ප්‍රදර්ශන (EXHIBITIONS)
- විවාද (DEBATES)
- සාකච්ඡා මණ්ඩල (PANEL DISCUSSIONS)
- සම්මන්ත්‍රණ (SEMINARS)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- ක්ෂණික කථා (IMPROMPTU SPEECHES)
- භූමිකා රංගන (ROLE PLAYS)
- සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම (PRESENTATION OF LITERATURE REVIEWS)
- ක්ෂේත්‍ර පොත් / ස්වභාව අධ්‍යයන දින පොත් / හොඳ වැඩ පොත් (FIELD BOOKS/ NATURE DIARIES)
- ප්‍රායෝගික පරීක්ෂණ (PRACTICAL TESTS)

පාඨමාර්ගයේ තුන්වන කොටස යෝජිත ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීමේ අවස්ථා හා ඒ සඳහා තෝරා ගෙන ඇති උපකරණ හඳුන්වා දීමට සැලසුම්කර තිබේ. මේ ආකාරයට ක්‍රියාකාරකම් තුළත් ඒවා අතරත් තක්සේරුව හා ඇගයීම දෙයාකාරයකින් සිදු කිරීමෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තව දුරටත් පුළුල් වන අතර ආශාවෙන් හා ප්‍රබෝධයෙන් ඉගෙනුමේ නියැලීමට සිසුනට හැකි වේ.

## 7.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

### උපදේශන නායකත්වය

මෙම විෂය ඉගැන්වීමේ දී විදුහල්පති උපදේශන නායකයකු ලෙස විශේෂ අවධානයක් යොමු කළ යුතු යි. තාක්ෂණ විෂය කණ්ඩයේ පවතින ශිල්ප කලා විෂයය කෙරෙහි පද්ධතියේ වර්තමානයේ පවතින අඩු තක්සේරුව සහ සෘණාත්මක චින්තනය වෙනස් කළ යුතු ව ඇත. ඒ සඳහා විදුහල්පතිවරුන් ට විෂය සංවර්ධනය සඳහා විශේෂ කැපවීමක් හා දායකත්වයක් දැරීමට සිදු වනු ඇත.

පාසලේ ගුරුවරුන්, සිසුන් හා දෙමාපියන් මෙම විෂය ඉගෙනීම සහ ඉගැන්වීම පිළිබඳ ව දැනුවත් කිරීම වැදගත් වේ.

එමෙන්ම මෙම විෂයය සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා විෂය සුදුසුකම් සහිත ගුරුවරු එම විෂයය සඳහා යෙදවීම හා විෂය ඉගැන්වීමට කැමැත්තක් සහිත ගුරුවරු සිටී නම් ඔවුන් ඒ සඳහා යොමු කර අවශ්‍ය පුහුණුව ලබා දීම ද වැදගත් වේ. එමෙන් ම විෂයය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ගුරුවරුන් ට ලබා දිය යුතු ය.

### කාල සටහන සැකසීම

10 වසර තාක්ෂණ කණ්ඩයේ විෂයයන් සඳහා සතියකට මිනිත්තු 40 කාලච්ඡෙද 3 ක්, වෙන් වේ. 2007 නව විෂයමාලා ප්‍රතිසංස්කරණ සමඟ ඉගෙනුම් ක්‍රමවේදය වෙනස් වන හෙයින් මෙම කාලච්ඡෙද තුන, එකලඟ සිටින ලෙස සැකසීමට හැකි නම් මෙම විෂයයේ ක්‍රියාකාරකම් කිරීමට පහසුවක් සැල සේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## වැඩටහන්

ශිල්ප කලා විෂයය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ඇත්තේ පන්ති කාමර ඉගැන්වීමට පමණක් සීමා නොවන අයුරිනි. එම විෂයයෙන් අපේක්ෂිත නිපුණතා ඉටුකර ගනිමින් ස්වයං නිර්මාණ හැකියාවන් වැඩි දියුණු කර ගනිමින් සාර්ථක ව්‍යවසායකත්වයක් කරා යොමු කර වීමට විවිධ ව්‍යාපාති යෝජනා කර තිබේ. කේවල මෙන්ම කණ්ඩායම් සහභාගීත්වයෙන් කළ හැකි නිර්මාණයන් ට අදාළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

ශිල්ප කලා විෂයයයේ ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ වැඩසටහන්

- ශිල්ප කලා තාක්ෂණ දිනයක් පැවැත්විම.
- තාක්ෂණ වැඩමුළු පැවැත්වීම.
- විෂයයට අදාළ බිත්ති පුවත්පත් ප්‍රදර්ශනය කිරීම.
- ක්ෂේත්‍ර චාරිකා
- ව්‍යාපෘති
- පාසල් මට්ටමින් නිර්මාණ ප්‍රදර්ශනය පැවැත්වීම.
- කොට්ඨාස/ කලාප/ ප්‍රදර්ශන පැවැත්වීම.
- පාසල් පොළ මඟින් සිසු නිර්මාණ අලෙවිකරණය ට අවස්ථාවක් ලබා දීම.
- ශිල්පකලා විෂයය උදෙසා වාර්ෂික ව සඟරාවක් වාර්ෂික ව නිකුත් කිරීම.

## ගුරුවරයා

පාසලේ පවත්නා සම්පත් අනුව ඉහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි ආකාරය හඳුනා ගැනීම හා ඒවා සාර්ථක ව ක්‍රියාත්මක කිරීම ගුරුභවතාගේ වගකීම වේ.

සාර්ථක ඉගෙනුම් පරිසරයක් සඳහා ආරක්ෂා සහිත පන්තිකාමරයක් හා නිර්මාණශීලී චින්තනයකින් යුතු න්‍යායික මෙන්ම ප්‍රායෝගික දැනුමකින් හෙබි ගුරුභවතුන් සිටීම වැදගත් ය.

ශිල්ප කලා විෂය නිපුණ සිසු පරපුරක් බිහි කර රටේ ආර්ථිකය ට දායක වීම සඳහා මඟ පෑදීම සඳහා විදුහල්පති හා ගුරුමණ්ඩලය ප්‍රතිපත්ති සකසා ගැනීම වැදගත් ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.